# විස්මිත කණ්නාඩිය



ඔමන්දී මිනෝදා දිසානායක

# විස්මිත කණ්නාඩිය

**ඔමන්දී මිනෝදා දිසානායක**

**ISBN 978-624-206-803-9**

කෘතිය පළ  කරන දිනය - 2023-11-15

**පිදුම**

මේ පොත නිර්මාණය කිරීමෙහිලා

සහාය වූ දෙමාපියන්ටත්

මග පෙන්වූ

මාගේ ගුරුවරුන්ටත්

සෙනෙහසින් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාව යි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පත්වරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදවු උපකාරකළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.10



එකමත් එක ලස්සන පුංචි ගමක වොන්ඩරීනා කියලා පුංචි දැරිවියක් ජීවත් වුණා. ඇය ජීවත් වුණේ වයසක ආච්චි අම්මා එක්ක. පරිසරයට ගොඩාක් ආදරය කළ ඇය පෙනුමින් හරිම රූමත්. දුටුවන්ගේ සිත් ඇදී යයි. ඇයගේ සිනහව හරිම ලෙන්ගතුයි.

ටික කලක් යද්දි ඇයගේ වයසක ආච්චි අම්මා මෙලොව හැර ගියා. ඉන් පසු ඇය ජීවත් වුණේ තනිවමයි. කාත් කවුරුත් නොමැතිව තනිව ජීවත් වූ වොන්ඩරීනා හරිම දුප්පත්. එනිසාම ගමේ සිටිය ගොඩාක් ළමයින් වොන්ඩරීනාට විහිළු කළා. හරිම ඉවසීමෙන් ජීවත් වුණත් වොන්ඩරීනාට දිගින් දිගටම එන මේ ගැරහුම්වලට මුහුණ දෙන්න බැරිව ගියා. අසරණ වොන්ඩරීනා එයාගේ ලස්සන ගම අත හැරලා දුරකට යන්න තීරණය කළා.



ලස්සන කුරුලු නාද මැද්දෙන්, සිසිල් සුළං හඬ මැද්දෙන් හෙමින් හෙමින් ඇය ඇගේ සුන්දර පරිසරයට සමු දෙමින් ගමින් පිටතට පැමිණියා.

කොහේ යන්නේ ද කුමක් කරන්නේ ද නොදත් වොන්ඩරිනා ඉන් පසු ඇතුල් වුණේ සුවිසල් මැදුරු, විශාල ගොඩනැගිලි, කඩිමුඩියේ එහෙ මෙහෙ දුවන මිනිසුන්ගෙන් පිරි නොසන්සුන් බිමකටයි.





ඇය පුදුමයෙන් මෙන් වට පිට බැලුවා. ඇයට අදහාගන්නවත් නොහැකි තරම් පුදුම හිතෙන මේ විශාල නගරයේ "මම දැන් කුමක් කරම්දැ" යි ඇයට සිතුණා.

මේ නොසන්සුන් නගරය මැද්දෙන් ඇවිදගෙන යන වොන්ඩරීනාට එක වරම "දූවේ" යැයි අමතනු ඇසුණා. ඇය වහා වටපිට බැලුවා. "මෙතරම් ලෙන්ගතු හඬක් ! " ඇය පුදුමයට පත් වුණා.

"මම විනීසා" යැයි හඳුන්වා දෙමින් මහළු කාන්තාවක් ලෙන්ගතු සිනහවක් පෑවා. අහිංසක වොන්ඩරීනා ඇය අසලට ළං වුණා.

"ආච්චි අම්මේ, මම වොන්ඩරීනා. එපිට ගමේ ඉඳන් ආවේ.  ඔයා තනිවම මේ කොහෙද යන්නේ?" යි වොන්ඩරීනා විමසුවා.

"මම නගරයට ආවා, කලමනා ටිකක් අරන් යන්න. ඔයා කොහෙද මේ යන්නේ ? අනෙක තනිවම මේ නගරය මැද්දේ" යි විනීසා ආච්චි අහන්න ගත්තා.



"ඒක දිග කතාවක් ආච්චි අම්මේ, ඉන්න මන් ඔයාට උදව් කරන්න" ඇය විනීසාගේ බඩු මල්ල අරගත්තා.

"ආච්චි කොහෙටද යන්න ඕන? මම බස් එක ළඟට ඔයාව එක්ක යන්නම්". වොන්ඩරීනාගේ අහිංසක කටහඬට විනීසා ආච්චිගේ සිත ඇදී ගියා.

"නැහැ දුවේ, ඔයා මේ කොහෙද යන්නේ කියල කියන්න. දැන් ගොඩක් හවස් වෙලා. අනෙක මේ තනිවම. දැන් ගෙදර යන්න. මට යන්න පුළුවනි." ආච්චි අම්මා වොන්ඩරීනාට අවවාද කළා.

ඒ සමගම අහිංසක වොන්ඩරීනාගේ ඇස්වල කඳුළු දුටු විනීසා ආච්චි ඇයත් කැටුව වීදියේ ගිමන් හලකට ඇතුල් වුණා. ඇයගෙන් තොරතුරු විමසුවා. වොන්ඩරීනා ඇයගේ සියලු තොරතුරු ආච්චිට කියන්න ගත්තා.

තනිව ජීවත් වූ විනීසා ආච්චිටත් හරි පුදුමයි. "එහෙනම් අපි අපේ ගෙදර යමු. මා ඉන්නෙත් තනිවම. අපිට සතුටින් ජීවත් වෙන්න පුළුවන්". වොන්ඩරීනා ආච්චිගේ අදහසට එකඟ වුණා. මේ පුංචි දැරිවිය විනීසා ආච්චී සමග පිටත් වුණා.

වෙනදා නොදැණුනු ආදරයක් සහ ආරක්ෂාවක් වොන්ඩරීනාට ඇයගෙන් ලැබුණා. විශාල මිල මුදල් ප්‍රමාණයක් නොතිබුණත් ඇය විනීසා ආච්චී සමග සතුටින් ජීවත් වුණා.

දිනක් වොන්ඩරීනා ඇයගේ හිස පීරන්න සිතාගෙන කාමරයේ ඇති කණ්නාඩිය අසලට ගියා. දුහුවිලි තැවරුණු කණ්නාඩිය සෙමින් පිසදමන්නට වුණා.

ආච්චී... ආච්චී.... වොන්ඩරීනා එකවරම කෑ ගසන්නට වුණා. බිය වූ විනීසා ආච්චි "ඇයි මගේ දුවේ" යි කියමින් වේගයෙන් කාමරය තුළට දිව ආවා.





ආච්චී මේ බලන්න මේ.....! විනීසා ආච්චී පුදුමයට පත් වුණා. දුවේ දියමන්ති... දි....දි... දියමන්ති ! දෙවියනේ කොහොමද මෙහෙම වුනේ ? ආච්චී කෑ ගසන්නට වුණා.

දෙදෙනාම සතුට දරාගත නොහැකිව කඳුළු පුරෝගෙන හඬන්න ගත්තා. "මගේ දුවේ ඔයා තමයි දියමන්ති ගෙනාවේ. මේ තරම් කාලයක් මේ කණ්නාඩිය මෙතනම තිබුණා. ඒත් ඔයා මේ කණ්නාඩිය දියමන්තියක් කළා. ඔයා මට දෙවියන් විසින් එවන ලද වාසනාවක්මයි දුවේ". විනීසා ආච්චි ඇයව තව තවත් තුරුලු කරගත්තා.



එදා පටන් ඇය නැවත පාසල් ගමන ආරම්භ කළා. විනීසා ආච්චී සමග සතුටින් ජීවත් වුණා.

කවුරුන් කෙසේ අපහසුතාවයට පත් කළත්, සියල්ල ඉවසා ජීවත් වුණු නිසා ම ඇය තනිව ගමන් කළ ජීවිතේ විනීසා ආච්චිගේ ආරක්ෂාව, ආදරය හා කරුණාව මැද්දෙන් ජීවිතය ජය ගත්තා.

නිමි.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයකන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023.11.01